# පාලන වාර්තාව

# நிருவாக அறிக்கை

# Administrative Report 2012

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## குடிவரவு - குடியகல்வுத் திணைக்களம்

## Department of Immigration & Emigration

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
අංක 41, ආනන්ද රාජකරුණා මාවත
කොළඹ 10

**Department of Immigration and Emigration**
41, Ananda Rajakaruna Mawatha, Colombo 10, Sri Lanka

**குடிவரவு - குடியகல்வுத் திணைக்களம்,**
41, ஆனந்த ராஜகருணா மாவத்த, கொழும்பு, இலங்கை.

දුරකථන අංකය : +94 11 5329400

# දැක්ම

කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම.

# நோக்கு

பிராந்தியத்தின் மிகச் சிறந்த குடிவரவுச் சேவையாக மாறுதல்

# Vision

To be the best immigration services in the region

# මෙහෙවර

ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින් රටින් බැහැරවන්නන් හා ඇතුළුවන්නන් නියාමනය කිරීම සහ පුරවැසි සේවා සැපයීම.

# பணி

தேசிய பாதுகாப்பு மற்றும் சமூக ஒழுங்கைப் பேணுவதுடன் பொருளாதார அபிவிருத்தியை ஏற்படுத்தவும் ஆட்களின் வருகை மற்றும் வெளிச் செல்லலைக் கட்டுப்படுத்துதலும் பிரசாவுரிமை சேவைகளை வழங்குதலும்.

## Mission

We regulate the entry and exit of persons, and provide citizenship services, while safeguarding the nation's security & social order, and promoting economic development

# හැඳින්වීම.

මෙතෙක් පැවති අනපනත්, රෙගුලාසි හා නියෝග මත පමණක්ම ක්‍රියාත්මක වන තත්ත්වයෙන් මිදී, දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු වර්තමාන සමාජ හා ආර්ථික අභිවෘද්ධි අවශ්‍යතාවයන් උදෙසා අනුගත කොට, ඒ සඳහා නවතම උපාය මාර්ග අනුගමනය කිරීම මගින් ඉතා ඵලදායී වූ රාජ්‍ය සේවයකට යොමු වීමට 2012 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවට හැකිවීම සුවිශේෂී බවක් පෙන්නුම් කරයි.

මේ අනුව මෙතෙක් ගමන් බලපත්‍ර නිකුත් කිරීම කෙරෙහි පමණක් දක්වන ලද වැඩි අවධානය, ප්‍රත්‍යන්ත පාලන කටයුතු ( Border Management) කෙරෙහි ද යොමු කරන ලදී. ඒ සඳහා ආරක්ෂක ලේකම් තුමාගේ මඟපෙන්වීමට අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට වීසා ලබා ගැනීම පහසුකර ලීම සඳහා මෙතෙක් පැවති සංචාරණය සඳහා වන වීසා ක්‍රමවේදය මුළුමනින්ම අහෝසි කර, අන්තර් ජාලය ඔස්සේ වීසා ලබා ගත හැකි වේගවත්, නම්‍යශීලී සහ පහසු ක්‍රමවේදයක් වන "සංචරණ සඳහා ඊ - පූර්ව වීසා අනුමැතිය (ETA)" මෙම වසරේ දී හඳුන්වා දෙන ලදී. **2012 ඔක්තෝබර් මාසය අවසාන වන විට ලංකාවට පැමිණි මිලියනය ඉක්මවූ සියලුම විදේශීය සංචාරකයන්, එම ක්‍රමවේදය හරහා මෙරටට පැමිණ තිබූ අතර එමගින් රජය ලද ආදායම මිලියන 2200 කි. එය මෙතෙක් රජයට අහිමි වී ගිය ශුද්ධ විදේශ ආදායමකි.**

එසේම රට තුලට විදේශිකයින් මෙන්ම ශ්‍රී ලංකිකයින් පැමිණීමේ දී හා පිටවීමේ දී ගුවන් තොටුපල හා වරාය මගින් වන සේවාව මෙම වසරේ දී වැඩි දියුණු කරන ලදී. මේ සඳහා ශ්‍රී ලාංකික ප්‍රත්‍යන්ත පාලන තොරතුරු අන්තර් ජාතික පොලීසිය හා සම්බන්ධ කරවීම ඉතා වැදගත් වූ හා සුවිශේෂී වූ කාර්යයක් විය. **ශ්‍රී ලංකාව, එසේ අන්තර් ජාතික පොලීසිය හා ආගමන විගමන තොරතුරු සම්බන්ධ කර සේවා සපයන ප්‍රථම දකුණු ආසියානු කලාපීය රට බවට පත්විය.**

**හම්බන්තොට මාගම් රුහුණුපුර වරාය** විවෘත කිරීමත් සමඟ එම වරායේ ආගමන හා විගමන කටයුතු සඳහා ද දායකත්වය ලබා දීමට මෙම දෙපාර්තමේන්තුවට හැකිවිය.

තව ද රටතුල වීසා රෙගුලාසි උල්ලංඝනය කරන විදේශිකයන් නියාමනය කිරීම සඳහා විශේෂ බුද්ධි හා විමර්ශන ඒකකයක් පිහිටුවන ලද අතර එසේ රෙගුලාසි උල්ලංඝනය කරනු ලැබූ විදේශිකයන් 499 දෙනෙකු රටින් පිට කිරීමට මෙමගින් හැකියාව ලැබිණි. එසේම විදේශිකයින් රඳවා තබා ගැනීම සඳහා ඉතා අබලන් තත්ත්වයේ පැවති මිරිහාන රැඳවුම් කඳවුර උසස් මට්ටමට නවීකරණය කර සැකසීමට හැකිවූ අතරම ස්ථිරසාර ස්ථානයක් ලෙස මිනුවන්ගොඩ ප්‍රදේශයෙන් රැඳවුම් කඳවුරක් සකස් කිරීමට සුදුසු භූමියක් ලබා ගැනීමට ද මෙම වසරේ දී අවකාශ ලැබිණි.

මෙම දෙපාර්තමේන්තුවට හිමි පළමු රාජ්‍ය දේපළ ලෙස ඉතිහාසයට එක් කරමින්, වව්නියාව ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කිරීම තුලින් 2012 වසරේ දී අප තවත් පියවරක් ඉදිරියට තැබූ අතර එමගින් උතුරු ප්‍රදේශයේ ජනතාවට ඉතා පහසුවෙන් හා කඩිනමින් සේවා සැපයීමට අපට හැකියාව ලැබිණි.

මෙම දෙපාර්තමේන්තුවට නව රාජ්‍ය සේවයක් බිහි කිරීමට උරදීමට හැකි වූ හැරවුම් ලක්ෂය වූ 2012 වසර තුල ජාත්‍යන්තර සම්මාන රැසකින්ම පිදුම් ලැබීමට හැකියාව ලැබිණි. ආසියානු පැසිපික් කළාපයේ **රටවල් 48ක ව්‍යාපෘති 99ක් අතරින් ලංකාවේ ETA ව්‍යාපෘතිය, හොඳම ව්‍යාපෘතිය බවට පත් වී, ජාත්‍යන්තර Future Gov සම්මානයෙන් පිදුම් ලැබීම 2012 වසරේ ලද විශාලම ජයග්‍රහණයයි.** තව ද මෙම වසරේ දී ජාත්‍යන්තර මැකෙන්

සම්මානයෙන් ද, හොඳම ඊ- රාජ්‍ය සේවය සඳහා වූ ස්වාභිමානී සම්මාන දෙකකින් ද, මානව හිමිකම් පිළිබඳ සම්මානයකින් ද මෙම දෙපාර්තමේන්තුව පිදුම් ලැබුවේ මහත් අභිමානයක් ශ්‍රී ලංකාවටම අත්කර දෙමිනි.

## 01 පරිපාලනය

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලන හා ප්‍රතිපත්ති අංශය විසින් 2012 වර්ෂය තුල සිදුකරන ලද විශේෂ කාර්යයන්.**

- **අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය වවුනියාව නගරයේ ස්ථාපිත කිරීම.**

රාජ්‍ය සේවාවන් මහජනතාව වෙත ගෙන යාමේ මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්තිය අනුව 2006 වර්ෂයේදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 03 ක් මාතර, මහනුවර, අනුරාධපුරය යන නගරවල ස්ථාපිත කරන ලදී. 2009 වර්ෂයේ යුද්ධය නිමාවී සාමය උදාවීමත් සමග උතුරු නැගෙනහිර ජනතාවට වඩාත් සමීප සේවාවක් ලබාදීම සඳහා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය වවුනියාව නගරයේ අංක ජේ.සී. 23, පිටරවුම් පාර, වවුනියාව දරණ ලිපිනයේ ස්ථාපිත කරන ලදී. මෙම කාර්යාලය රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස්.හෙට්ටිආරච්චි මහතාගේ ප්‍රධානත්වයෙන් 2012.02.08 දින විවෘත කරන ලදී.

වවුනියාව නගරයේ මෙම කාර්යාලය ස්ථාපනය කිරීමට සුදුසු ගොඩනැගිල්ලක් සොයා ගැනීමට වෙහෙසෙන අවස්ථාවේ වවුනියාව දිස්ත්‍රික් ලේකම්/දිසාපති පී.එස්.එම්.චාර්ල්ස් මහත්මිය විසින් මෙම දෙපාර්තමේන්තුවට රජයේ ගොඩනැගිලි දෙකක් නීත්‍යානුකූලව පවරා දෙන ලදී. ඉන් අංක ජේ.සී. 23, පිටරවුම් පාර, වවුනියාව ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ල රුපියල් මිලියන 12 ක් පමණ වැය කොට නවීකරණය කොට ප්‍රාදේශීය කාර්යාලය පිහිටුවන ලද අතර, නො: 13, වවුනියාව ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ල නිලධාරීන්ගේ නවාතැන් සඳහා යොදා ගන්නා ලදී. මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළුම කාර්යාල කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වා ගෙන යනු ලැබේ. **වවුනියාව දිස්ත්‍රික් ලේකම් විසින් පවරා දුන් ඉහත ගොඩනැගිලි දෙක මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 63 කට පසු දෙපාර්තමේන්තුව සතු දේපලක් බවට පත්වීම සුවිශේෂී සිදුවීමකි.**

- **බලයලත් නිලධාරීන් ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරට උසස් කිරීම.**

මෙම වර්ෂය තුල ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී පුරප්පාඩු තනතුරු 07 ක් සඳහා බලයලත් නිලධාරීන් පහත සඳහන් පරිදි උසස් කරන ලදී.

| දිනය | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| 2012.01.02 | 02 |
| 2012.01.17 | 01 |
| 2012.03.07 | 04 |

අංක 1733/52 හා 2011.11.25 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ගැසට් පත්‍රය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බලය පැවරීම අනුව පාලක ජනරාල්වරයාට පැවරී තිබූ බලතල මත මෙම උසස් කිරීම් අප්‍රමාදව ඉටු කිරීමට හැකිවිය.

- **නව තනතුරු ඇති කිරීම.**

i. දෙපාර්තමේන්තුවේ පවතින වර්තමාන සේවා අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කාර්ය මණ්ඩලයේ සංයුතිය හා ඇතැම් තනතුරු වෙනස් කරන ලදී. ඒ අනුව දෙපාර්තමේන්තුවේ මෙතෙක් පැවති පරිගණක දත්ත සටහන්කරු තනතුරු 35 ක් යටපත් කොට ගමන් බලපත්‍ර සහායක තනතුරු 35 ක් 2012.07.01 දින අළුතින් ඇති කරන ලදී.මෙම තනතුරු 35 සඳහා දැනට සේවයේ යෙදී සිටින පරිගණක දත්ත සටහන්කරුවන් 35 දෙනා අන්තර්ග්‍රහණය කිරීමටත් ඉන් පසුව ඇතිවන පුරප්පාඩු අනුව ඒ සඳහා නව නිලධාරීන් බඳවා ගැනීමටත් අපේක්ෂා කෙරේ.

ii. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල කඩිනමින් විවෘත කිරීමට රජය තීරණය කිරීමත් සමග එම ගුවන් තොටුපල සඳහා අනුයුක්ත කිරීමට බලයලත් නිලධාරීන් සංඛ්‍යාව වැඩි කිරීමේ අවශ්‍යතාවය පැන නැගුනි. එම අවස්ථාව වන විට පැවති බලයලත් නිලධාරී තනතුරු 288 ක් ඒ සඳහා ප්‍රමාණවත් නොවීය. එම නිසා අළුතින් බලයලත් නිලධාරීන් තනතුරු 70 ක් මු.රෙ. 71 යටතේ 2012.07.17 දින ඇති කරන ලදී. එම නිලධාරීන් බඳවා ගැනීම සඳහා තරඟ විභාගය පැවැත්වීමට අදාල ගැසට් නිවේදනය 2012.09.28 දින ප්‍රසිද්ධ කරන ලදී.

iii. 2012.07.27 දිනැතිව ශ්‍රී ලං.ග.සේ. 1/11 ශ්‍රේණියේ තනතුරක් මු.රෙ.71 යටතේ ඇති කරන ලද අතර, එම තනතුර ගණකාධිකාරී ආදායම් ලෙස නම් කරන ලදී. ඒ වන විට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා පැවති ශ්‍රී ලං.ග.සේ.111 ශ්‍රේණියේ තනතුර ශ්‍රී ලං.ග.සේ.1 ශ්‍රේණියේ තනතුරක් ලෙස 2012.07.27 දින උත්ශ්‍රේණි ගත කරන ලදී.

## 2012.12.31 දිනට කාර්ය මණ්ඩලය.

| තනතුර | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|---|
| පාලක ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ.විශේෂ | 01 | 01 | - |
| පාලක | ශ්‍රී.ලං.ප.සේ 1 | 05 | 05 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ 1 | 01 | 01 | - |
| නියෝජ්‍ය/සහකාර පාලක | ශ්‍රී.ලං.ප.සේ 11/111 | 40 | 35 | 05 |
| නියෝජ්‍ය පාලක | දෙපාර්තමේන්තුමය | 02 | - | 02 |
| සහකාර පාලක | එම | 08 | 05 | 03 |
| ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ 11 | 02 | 01 | 01 |
| අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ 1 | 01 | 01 | - |
| පරිපාලන නිලධාරී | රා.ක.ස.අධි ශ්‍රේණිය | 02 | 02 | - |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී | දෙපාර්තමේන්තුමය | 30 | 28 | 02 |
| පද්ධති විශ්ලේෂක | ශ්‍රී ලං.තො.තා.හා සං.සේ. | 01 | - | 01 |
| බලයලත් නිලධාරී | දෙපාර්තමේන්තුමය | 358 | 279 | 79 |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවා | 01 | 01 | -- |
| පුහුණු කළමණාකරු | එම | 01 | 01 | -- |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | රා.ක.ස.සේ | 368 | 301 | 67 |
| දත්ත සටහන්කරු | දෙපාර්තමේන්තුමය | 36 | 31 | 05 |
| පිලිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තුමය | 02 | 01 | 01 |

| | | | | |
|---|---|---|---|---|
| රියදුරු | රියදුරු සේවය | 29 | 22 | 07 |
| කා.සේ.සේ. | කා.සේ.සේ. | 104 | 90 | 14 |
| නියාමක | දෙපාර්තමේන්තුමය | 03 | 03 | -- |
| කම්කරු | කොන්ත්‍රාත් පදනම | 02 | 02 | -- |
| **එකතුව** | | **997** | **810** | **187** |

- **<u>වාහන.</u>**

2012 වසර වන විට දෙපාර්තමේන්තුවේ රාජකාරී ප්‍රසාරණය වී තිබූ ප්‍රමාණයට සරිලන පරිදි වාහන ප්‍රමාණවත් නොවීය. එම තත්වය මගහරවා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් කල් බදු ක්‍රමය යටතේ වාහන 06 ක් දෙපාර්තමේන්තුව වෙත ලබාගන්නා ලදී.

- **<u>දිරි දීමනා.</u>**

දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක දිරි දීමනා ක්‍රමය වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කරන ලදී. එම සංශෝධනය සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය 2012.09.05 දිනද, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය 2012.12.14 දිනද ලබාගන්නා ලදී.

- **<u>මිරිහාන රැඳවුම් කඳවුර අළුත්වැඩියා කිරීම.</u>**

දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය හා විශේෂ විමර්ශන හා බුද්ධි නියාමන ඒකකය මගින් දිවයින පුරා වැටලීම් කොට අත්අඩංගුවට ගන්නා නීති විරෝධී ලෙස දිවයිනේ රැඳී සිටින හා නීති විරෝධී ක්‍රියාවල නිරත වන විදේශිකයින් රටින් පිටමං කරන තෙක් රඳවා තබනු ලබන්නේ මිරිහාන පොලිස් ස්ථාන භූමියේ පිහිටුවා ඇති රැඳවුම් කඳවුරෙහිය. මෙම රැඳවුම් කඳවුර අළුත්වැඩියා කලයුතු තත්වයක පැවතිනි. කඳවුර පිහිටි භූමිය දෙපාර්තමේන්තුව සතු වූවක් නොවන බැවින් නව ගොඩනැගිලි ඉදි කිරීමේ අසීරුතා පවතී. මෙයට පිළියමක් වශයෙන් සංක්‍රමණිකයින් පිළිබඳ ජාත්‍යන්තර ආයතන සමග සාකච්ඡා කොට එම ආයතනයේ අනුග්‍රහය යටතේ රුපියල් මිලියන 13 ක් වැය කොට මෙම කඳවුර නවීකරණය කරන ලදී. නමුත් මෙම දෙපාර්තමේන්තුවටම අයත් කඳවුරක අවශ්‍යතාවය දැඩි ලෙස දැනෙන්නට විය.

- **<u>මීනුවන්ගොඩ ප්‍රදේශයේ නව කඳවුරක් ඉදි කිරීම.</u>**

ඉහත ගැටළුවලට විසඳුමක් වශයෙන් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට ආසන්නයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල්ලේගෙදර ග්‍රාම නිලධාරී වසමේ වසා දමා තිබූ ගල්ලේගෙදර මහා විද්‍යාල භූමියෙන් පර්චස් 100 ක් මෙම දෙපාර්තමේන්තුවට ලබාගැනීමට කටයුතු කරන ලදී. මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ සහයෝගයෙන් මෙම ඉඩම හඳුනා ගන්නා ලදී.

ඒ අනුව ඉඩම මෙම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු ආරම්භ කරන ලද අතර, ඊට සමගාමීව ගොඩනැගිල්ල ඉදි කිරීමට අවශ්‍ය මූලික සැලසුම් කටයුතුද ආරම්භ කරන ලදී. ඒ අනුව ඉඩම මැන මූලික පිඹුර මිනින්දෝරු දෙපාර්තමේන්තුව හරහා ලබා ගන්නා ලද අතර, පස පරීක්ෂා කිරීමේ කටයුතු භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය හරහා කරගන්නා ලදී. පස් පරීක්ෂා කිරීමේ වාර්තාව 2012 අගෝස්තු වන විට ලබාගැනීමට හැකිවිය.

ගොඩනැගිලි සැලසුම් කටයුතුද වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලවා කරගන්නා ලද අතර, මූලික ඇස්තමේන්තුව රු.මි.200 කි. එම ගොඩනැගිලි සැලසුම් හා ඇස්තමේන්තුව සඳහා ජාතික ක්‍රම සම්පාදන

දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2012.11.14 දින වන විට ලබාගැනීමට හැකිවිය. ඒ අනුව මෙම ගොඩනැගිල්ල අදියර 02 ක් යටතේ ඉදි කිරීමට කටයුතු කෙරේ. පලමු අදියර සඳහා 2013 වර්ෂයේ රු.මි.50 ක් ද, දෙවන අදියර සඳහා 2014 වර්ෂයේ රු.මි.150 ක්ද වශයෙන් මෙම අදියර දෙක ක්‍රියාත්මක කෙරේ. මෙම රඳවුම් කඳවුර කාන්තා හා පිරිමි රඳවියන් 100 කට නේවාසික පහසුකම් සහිතව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉදි කිරීමට සැලසුම් කොට ඇත.

- **<u>මහජන පියස.</u>**

ගමන් බලපත් ලබාගැනීම, ගමන් බලපත් සංශෝධනය කිරීම, වීසා ලබාගැනීම, පුරවැසි අංශයේ රාජකාරී ඇතුළු විවිධ සේවාවන් ලබාගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට දිනකට 6000 ක් පමණ දෙනා පැමිණෙති. සේවාලාභීන් සමග ඔවුන්ගේ සහායට පැමිණෙන අයට සේවාලාභියාගේ සේවය අවසන් වනතෙක් රැඳී සිටීමට " **මහජන පියස"** නමින් ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව පවතින ශාලාව මොබිටෙල් ආයතනයේ අනුග්‍රහයෙන් නවීකරණය කරන ලදී. ඒ යටතේ සමස්ත ශාලාවම ප්‍රතිසංසංස්කරණය කොට, වායු සමනය කොට රූපවාහිනි යන්ත්‍ර සවි කරන ලදී. ඒ සඳහා මොබිටෙල් ආයතනය විසින් දරන ලද පිරිවැය රු.මි.1.2 කි. නවීකරණය කරන ලද පියස 2012.10.17 දින විවෘත කරන ලදී.

## 1.2 <u>ප්‍රසම්පාදන අංශය.</u>

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට වාර්ෂිකව අවශ්‍ය කරන භාණ්ඩ හා සේවාවන් වඩාත් නිවැරදිවත්,පාරදෘෂ්‍ය භාවයෙන් යුතුවත්, රජයේ ප්‍රසම්පාදන සංග්‍රහය හා ඊට අදාල නීතිරීති අනුගමනය කරමින් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන අංශයක් පිහිටුවා ඇත. එම අංශය සහකාර පාලකවරයෙකු යටතේ, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. මෙම අංශය විසින් සෑම වර්ෂයක් ආරම්භයේදීම එම වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලැබේ. එම ප්‍රසම්පාදන සැලැස්ම අනුව භාණ්ඩ හා සේවාවන් මිලදී ගන්නා අතර, 2012 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් කරමි.

| අනු අංකය | භාණ්ඩ | භාණ්ඩවල වටිනාකම<br>රුපියල් |
|---|---|---|
| 01 | කාර්යාලීය උපකරණ | 1.516,809.86 |
| 02 | වායු සමීකරණ යන්ත්‍ර | 122,490.00 |
| 03 | මුද්‍රණ යන්ත්‍ර සහ පැක්ස් යන්ත්‍ර | 260,400.00 |
| 04 | පරිගණක පද්ධතියට අදාල උපකරණ | 1,923,040.00 |

| | | |
|---|---|---|
| 05 | වාහන | 520,000.00 |
| | **එකතුව** | **4,342,739.86** |

## 2012 වසරේ ගිවිසුම් ගතවීම් සඳහා කරන ලද ගෙවීම්.

| | විස්තරය | ගිවිසුම් විස්තරය | | අවුරුද්දකට සේවා ගාස්තුව (බදු රහිතව) |
|---|---|---|---|---|
| | | ආරම්භක දිනය | කල් ඉකුත් වෙන දිනය | |
| **සේවා සැපයුම්කරු** | **සේවා ගිවිසුමේ නම** | | | |
| ඉන්ටර්නැෂනල් කම්පියුටර් සිලෝන් ලිමිටඩ් | ඊ මේල්,ඉන්ටනෙට් ඇන්ටි වෛරස් සොලියුෂන් නඩත්තුව | 01.07.2012 | 30.06.2013 | 1,095,000.00 |
| | සයිබර් ෆයර්වෝල් බලපත්‍ර ගාස්තු 2012 | | | 1,221,740.00 |
| අයි.බී.එම්.වර්ඩ් ට්‍රේඩ් කෝපරේෂන් | දෘඩාංග නඩත්තුව | 01.01.2012 | 31.12.2014 | 3,656,344.56 |
| ඊ.ඩබ්.ඉන්ෆොමේෂන් සිස්ටම් ලිමිටඩ් | පරිගණක 27 නඩත්තුව | 20.01.2012 | 19.01.2013 | 359,741.25 |
| | පරිගණක 37 නඩත්තුව | 01.01.2012 | 31.12.2012 | 565,826.25 |
| | පරිගණක 05 නඩත්තුව | 23.02.2012 | 22.02.2013 | 55,800.00 |
| | මුද්‍රණ යන්ත්‍රය නඩත්තුව | 16.12.2012 | 15.12.2013 | 190,680.00 |
| | ප්‍රාදේශීය කාර්යාලවල පරිගණක නඩත්තුව | 04.10.2012 | 03.10.2013 | 372,000.00 |
| | පරිගණක 200 නඩත්තුව | 17.12.2012 | 16.12.2013 | 1,493,800.00 |
| | පරිගණක 50 නඩත්තුව | 22.01.2012 | 21.01.2013 | 373,450.00 |
| ඉන්ෆොමැටික් ඉන්ටර්නැෂනල් | මෘදුකාංග නඩත්තුව | 01.04.2012 | 31.03.2013 | 3,886,792.95 |

| | | | | |
|---|---|---|---|---|
| (ප්‍රයි)ලිමිටඩ් | | | | |
| | ඒ.පී.සී. යූ.පී.එස්.හාඩ්වෙයාර් නඩත්තුව | 01.05.2012 | 30.04.2013 | 890,450.00 |
| | ප්‍රාදේශීය කාර්යාලවල ඒ.පී.එස්. .යූ.පී.එස්.නඩත්තුව | 01.11.2012 | 31.10.2013 | 355,311.00 |
| | ඔරකල් මෙට්ලින්ක් සහය සේවා බලපත්‍ර ගාස්තුව | 26.11.2012 | 25.11.2013 | 3,627,024.02 |
| | මෙහෙයුම් කළමණාකරණ සහාය සේවා | 14.08.2011 | 13.08.2012 | 8,400,000.00 |
| එපික් ලංකා (ප්‍රයිවෙට්)ලිමිටඩ් | එෆ්.ඒ.පී.නඩත්තුව | 01.04.2012 | 31.03.2013 | 8,282,273.12 |
| | විෂුවර්ලයසිර් 03 නඩත්තුව | 13.05.2012 | 12.05.2013 | 364,022.12 |
| | ප්‍රාදේශීය කාර්යාලවල එපික් TPPS පහසුකම් නඩත්තුව | 01.05.2012 | 30.04.2013 | 1,260,000.00 |
| | ශාඛා වියාප්ත කිරීමේ ව්‍යාපෘතිවල දේශියව මිලදී ගත් දෘඩාංග නඩත්තුව | 01.07.2012 | 30.06.2013 | 1,076,788.00 |
| හයිටෙක් පාදු බර්හාඩ් | ආපදා ප්‍රතිපාදන පහසුකම් සේවා සහ දෙවන කාර්යාලය නඩත්තුව | 19.08.2012 | 18.08.2013 | USD 117,815.00 |
| | ආපදා ප්‍රයෝජන. පහසුකම් සහ දෙවන කාර්යාලය සඳහා බදු | 01.08.2007 | 01.02.2013 | 19,200,000.00 |
| | ශාඛා ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිවල විදේශියව මිලදී ගත් දෘඩාංග නඩත්තුව | 01.07.2012 | 30.06.2013 | USD 123,156.56 |

## 1.3 පුහුණු හා සංවර්ධන ඒකකය.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරින්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන ඊට ගැලපෙන පරිදි පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයයි. ඒ සඳහා වෙනම පුහුණු ඒකකයක් පිහිටුවා ඇති අතර, එම ඒකකය පුහුණු කළමණාකරුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. එම අංශයට

ලිපිකරුවන් දෙදෙනෙකු හා කා.සේ.සේ.වරයකු අනුයුක්ත කර ඇති අතර, අවශ්‍ය අවම ප්‍රමාණයෙන් උපකරණ සපයා ඇත. එම අංශය මගින් 2012 වර්ෂයේ සංවිධානය කරන ලද පුහුණු වැඩ සටහන් ප්‍රමාණය පහත සඳහන් කරමි.

| වැඩ මුළුව පැවැත්වූ දිනය | වැඩ මුළුව | පවත්වනු ලැබුවේ කා වෙනුවෙන්ද / දෙපාර්තමේන්තුව |
|---|---|---|
| 2012.01.26 | රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණය | සමුපකාර සංවර්ධන කොමසාරිස්, සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරු |
| 2012.02.23 | රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණය | විදේශ කටයුතු අමාත්‍යාංශය අනුයුක්ත නිලධාරීන් |
| 2012.03.02,5,6,8,9 | සේවාරම්භක පුහුණු වැඩ මුළුව | බලයලත් නිලධාරින් |
| 2012.03.12 | සංනිවේදන මාධ්‍ය | කොළඹ ඩී.එස්.සේනානායක විද්‍යාලයේ 13 වසරේ ඉගෙනුම ලබන සිසුන් |
| 2012.03.17 | **"නැණස අසිරිය"** වැඩ මුළුව | ස්ථාන මාරුවී පැමිණි නිලධාරින් |
| 2012.05.15, 18,22,23,24 | **යහ පාලනය** | බලයලත් නිලධාරීන් |
| 2012.06.06 | රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණය | ශ්‍රී.ලං.ප.සේ.111 නිලධාරීන් |
| 2012.06.13 | **යහ පාලනය** | බලයලත් නිලධාරීන් |
| 2012.06.26, 27 | ETA ක්‍රම වේදය | ශ්‍රී.ලං.ප.සේ 2011/2012 ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් |
| 2012.07.26 | ETA ක්‍රම වේදය | ශ්‍රී.ලං.ප.සේ.111 ශ්‍රේණියේ නිලධාරීන් |
| 2012.08.09 | ආගමන හා විගමන විමර්ශන ක්‍රියාවලිය | ශ්‍රී ලංකා නාවික හමුදාවේ බුද්ධිමය කටයුතු නිලධාරින් |
| 2012.08.15 | ETA ක්‍රම වේදය | ශ්‍රී.ලං.ප.සේ.2011/2012 ස්ථාන මාරුවී පැමිණි නිලධාරින් |
| 2012.08.02 | ජාත්‍යන්තර සබඳතා ඒකකයේ කටයුතු | බලයලත් නිලධාරීන් |

| | | |
|---|---|---|
| | පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ මුළුව | |
| 2012.08.21 | රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණය | ශ්‍රී.ලං.ප.සේ.111 ශ්‍රේණියේ නිලධාරීන් |
| 2012.09.10 | **අද්විතීය පාරිභෝගික සත්කාරය** | 2011/2012 ස්ථාන මාරුවී පැමිණි සියළුම නිලධාරින් |
| 2012.09.11 ,13,18 | සංක්‍රමණික කළමණාකරණය | බලයලත් නිලධාරින් |
| 2012.09.21 | ILO වැඩ මුළුව | බලයලත් නිලධාරින් |
| 2012.10.06 | **මම උපන්නේ දිනන්නයි** | දෙපාර්තමේන්තු නිලධාරින්ගේ පවුලේ අය. |
| 2012.10.23 | රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණය | උපාධිධාරී අභ්‍යාසලාභීන් වෙනුවෙන් |
| 2012.11.07 | රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණය | උපාධිධාරී අභ්‍යාසලාභීන් වෙනුවෙන් |
| 2012.12.08 | සේවාස්ථ පුහුණු පාඨමාලාව | රියදුරු මහතුන් සඳහා |
| 2012.12.10 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය | බලයලත් නිලධාරීන් |
| 2012.12.21 | ජාත්‍යන්තර සහයෝගිතා අංශයේ මෙහෙයුම් ක්‍රියාවලිය | ශ්‍රී ලංකා නාවික හමුදාවේ බුද්ධිමය කටයුතු නිලධාරින් |

## 1.4 නීති අංශය.

**දෙපාර්තමේන්තුවේ නීති අංශය විසින් 2012 වසර තුලදී පහත දැක්වෙන කාර්යයන් සහ රාජකාරී ඉටු කර ඇත.**

i. දෙපාර්තමේන්තුව සහ පුද්ගලිකව පාලක ජනරාල් වග උත්තරකරුවන් ලෙස නම් කරනු ලැබ ඇති ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම් පත් දෙකක් සම්බන්ධයෙන් අවශ්‍ය නිරීක්ෂණ සකස් කිරීම සහ අවශ්‍ය ලේඛණ අධිකරණය වෙත යොමු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව සමග කටයුතු කොට ඇත.

ii. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් ආගමන හා විගමන පනත යටතේ නඩු පැවරීම් කරනු ලැබූ අවස්ථාවලදී අදාල නඩු සඳහා ආගමන හා විගමන පාලක ජනරාල් සාක්ෂිකරුවකු ලෙස නම් කර ඇති අවස්ථාවලදී අදාල ලේඛණ ඉදිරිපත් කරමින්, දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අවස්ථා 229 කදී අධිකරණය වෙත සාක්ෂි ඉදිරිපත් කොට ඇත.

iii. මානව හිමිකම් කොමිෂමට ඉදිරිපත් වූ අයදුම් පත් සම්බන්ධව අවස්ථා 3 කදී දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සාර්ථකව කරුණු ඉදිරිපත් කොට ඇත.

iv. සිවිල් නඩුවලදී දෙපාර්තමේන්තුව සාක්ෂිකරුවකු ලෙස නම් කර ඇති අවස්ථා 04 කදී දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සාක්ෂි ලබාදී ඇත.

## 02 <u>මුදල් අංශය.</u>

ප්‍රමුඛ ආදායම් ලබන දෙපාර්තමේන්තුවක් වන ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ආදායම් හා වියදම් පිළිබඳ කළමණාකරණය, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු නියමිත සීමාවන් තුල පවත්වා ගෙන යාම, භාණ්ඩාගාර නියමයන්ට අනුකූලව මූල්‍ය කටයුතු මෙහෙයවීම හා වාර්ෂික අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණකාධිකාරිවරයෙකුගේ සහ සහකාර ගණකාධිකාරීවරු දෙදෙනෙකුගේ අධීක්ෂණය යටතේ සිදුවේ. පරිපාලන නිලධාරී (මුදල්) සහ කලමණාකරණ සහකාර සේවයේ නිලධාරීන් 55 දෙනෙකුගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩලයක්, ගිණුම් අංශය /සරප් අංශය හා ගබඩා අංශවලට අදාලව සේවය කරයි.

දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය වාර්ෂික වියදම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 1000 ක් පමණ වන අතර 2012 වර්ෂයේදී එය රුපියල් මිලියන 695 ක් විය.

මෙම දෙපාර්තමේන්තුව නව ගමන් බලපත් නිකුත් කිරිම, වීසා නිකුත් කිරිම, සංචරනය සඳහා වන විද්‍යුත් අනුමැති ව්‍යාපෘතිය හා ද්විත්ව පුරවැසි සහතික පත් නිකුත් කිරීම, මගින් වාර්ෂිකව සැලකිය යුතු ආදායමක් ඒකාබද්ධ අරමුදලට බැර කරයි. 2011 වර්ෂයේදී ආදායම රුපියල් මිලියන 3764 ක් වූ අතර, 2012.01.01 දින සිට ක්‍රියාත්මක වූ අන්තර් ජාලය ඔස්සේ කෙටිකාලීන වීසා නිකුත් කිරීමේ නව ව්‍යාපෘතිය නිසා 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ආදායම රුපියල් මිලියන 6181 ක් දක්වා වර්ධනය වී ඇත.

කෙටිකාලීන සංචරනය සඳහා පූර්ව විද්‍යුත් අනුමැති ව්‍යාපෘතිය 2012 වර්ෂයේ ජනවාරි 01 දින සිට ආරම්භ කල අතර, එමගින් රුපියල් මිලියන 2000 ක ආදායමක් ඇස්තමේන්තු කලද 2012 වර්ෂය සඳහා එම ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 2200 ක ආදායමක් උපයා ඇත. මෙය දෙපාර්තමේන්තුවේ මුළු ආදායමෙන් 35% ක් පමණ වේ.

2012 වර්ෂයේ උපයන ලද මුළු ආදායමෙන් 52% ක් නව ගමන් බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම හා සංශෝධනය කිරීම මගින්ද, ආදායමෙන් 11% ක් වීසා නිකුත් කිරීම මගින්ද උපයා ඇත.

2012 වර්ෂයට අදාලව ව්‍යාපෘති එක හා දෙක යටතේ ලැබී ඇති ඇස්තමේන්තු ප්‍රතිපාදන, තත්‍ය වියදම හා මූල්‍ය ප්‍රගතිය දැක්වෙන වාර්තාද 2012 වසරේ දෙපාර්තමේන්තු සමස්ථ ආදායම ඇතුලත් ආදායම් වාර්තාද රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 2002.09.12 හි 2.4 අනුව මේ සමග ඉදිරිපත් කරමි. **(ඇමුණුම 01,02,03,04, 05 බලන්න.)**

## 03 **තොරතුරු තාක්ෂණය.**

**පසුගිය වර්ෂයේ මෙම අංශයෙන් සිදුවූ ප්‍රධාන කාර්යයන්.**

i. පවත්නා පරිගණක පද්ධතියේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට හා ජාත්‍යන්තර මට්ටමට පත් කිරීම සඳහා 11 G සේවා තත්වයට වැඩි දියුණු කරන ලදී.

ii. නැව් කාර්ය මණ්ඩලයේ ගොඩබැසීමේ අවසර පත්‍රය එනම් අදාල නැව ශ්‍රී ලංකාවේ වරායක නැංගුරම් ලා සිටින විට එම කාර්ය මණ්ඩලයට ගොඩබිමට පැමිණීමට ලබාදෙන අවසර පත්‍රය මුද්‍රණය කිරීම සඳහා මෘදුකාංග නවීකරණය කරන ලදී. මීට ප්‍රථම එම අවසර පත්‍රය අතින් ලියූ අතර ඔවුන් පිළිබඳ කිසිම තොරතුරක් පද්ධති ගත නොවුනි.

iii. ඉලෙක්ට්‍රොනික දත්ත පුවරු සවි කරන ලදී. (Dash Borad) මේ මගින් ගමන් බලපත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය පිළිබඳ අධීක්ෂණය කිරීම සිදුවේ. ගමන් බලපත් අයදුම් පත්‍රයක් භාරදුන් අවස්ථාවේ සිට නිකුත් කර අවසන් වන තුරු ඒ ඒ පියවරයන් සඳහා නිශ්චිත වූ කාල පරාසයක් වෙන් කිරීම මගින් ගමන් බලපත් නිකුත් කිරීම, වඩාත් කාර්යක්ෂම කිරීම මෙයින් බලාපොරොත්තු වේ.

iv. වසර 2000/2007 දක්වා වූ කාලය තුලදී විදේශයන්හිදී සිදුවූ ශ්‍රී ලාංකික දරු උපත් පුරවැසි පනතේ 5(2) වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇති නමුත් එම තොරතුරු පරිගණක පද්ධතියට ඇතුලත් කර නොතිබුනි. මේ වන විට එම තොරතුරු පද්ධති ගත කිරීම නිසා අවශ්‍ය අවස්ථාවන්හිදී එම තොරතුරු පහසුවෙන් සහ ඉක්මණින් සොයා ගැනීමට හැකියාව ලැබී ඇත.

v. විද්‍යුත් සංචරන පද්ධතිය මගින් ශ්‍රී ලංකාවට ගොඩබැසිමට අවසර ලත් විදේශිකයන්ගේ ගමන් බලපත්‍රයන්හි ඇලවීම සඳහා විද්‍යුත් ස්ටිකරයක් ප්‍රත්‍යාන්ත පාලන පද්ධතිය තුලින් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. මීට පෙර මෙම කර්තව්‍යය සිදුවූයේ මුද්‍රාවක් මගිනි. එය විධිමත් නොවූ බැවින් මෙලෙස විද්‍යුත් ස්ටිකරයක් භාවිතා කිරීම ආරම්භ කරන ලදී.

vi. මානව සම්පත් කළමණාකරණ මොඩියුලය වැඩි දියුණු කරන ලදී.

vii. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පද්ධති මාර්ගයක් විවෘත කර දෙන ලදී. එහි ලියාපදිංචි වූ ශ්‍රමිකයන්ගේ විදේශ ගමන් පිළිබඳ තොරතුරු ලබාගැනීමේ හැකියාව ලබාදී ඇත.

viii මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ආගමන විගමන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සකස් කිරීමේ මූලික කටයුතු මෙම වසර තුලදී සිදුකරන ලදී.

## 04. **වීසා හා ප්‍රත්‍යාන්ත පාලන අංශය.**

- **වීසා.**

මෙම වසර තුල ජාතික ආරක්ෂාව මූලික කරගෙන වීසා නිකුත් කිරීම් හා දීර්ඝ කිරීම් කරනු ලැබූ අතර ඒ අනුව විදේශිකයන් සඳහා නිකුත් කරන ලද වීසා අවසන් කිරීම්, අවලංගු කිරීම් හා අත්හිටුවීම්

කරන ලදී. එසේම ජාතික ආරක්ෂාව සහ ශ්‍රී ලාංකිකයන්ට බාධාවක් වූ හා ප්‍රශ්න සහගත වූ විදේශිකයන් මෙරටට පැමිණීම වැලැක්වීම සඳහා ඔවුන්ගේ තොරතුරු අසාධු ලේඛණ ගත කිරිමට කටයුතු කරන ලදී.

- **<u>නේවාසික වීසා</u>**

විවිධ පරමාරථ, අරමුණු වෙනුවෙන් ලංකාව තුල දීර්ඝ කාලීනව රැඳී සිටින විදේශිකයින් සඳහා නිකුත් කෙරෙන මෙම වීසාව කරුණු ගණනාවක් යටතේ නිකුත් කෙරේ. සේවා නියුක්තිකයන්, ආයෝජකයින්, ශිෂ්‍යයන්, ලියාපදිංචි ඉන්දියානුවන්, ශ්‍රී ලංකා පුරවැසි බව අවසන් කල තැනැත්තන්,ශ්‍රී ලංකා පුරවැසියෙකුගේ පවුලේ සාමාජිකයන්, රාජ්‍යතාන්ත්‍රිකයන්,නේවාසික ආගන්තුක වීසා යෝජනා ක්‍රමයේ හා මගේ සිහින නිවස වීසා යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී සිටින තැනැත්තන් වෙත නේවාසික වීසා නිකුත් කරනු ලැබේ.

- **<u>ආගන්තුක වීසා.</u>**

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් වීසා ලබාගෙන පැමිණෙන තැනැත්තන් හා දිවයිනට ඉලෙක්ට්‍රොනික සංචරන අනුමැතිය භාවිතයෙන් පැමිණෙන විදේශිකයන් මසක් ඉක්මවා රැඳී සිටීම සඳහා ලබාගන්නා වීසාව හැටියට මෙය සැලකේ. මේ අනුව පැමිණි විදේශිකයින්ගෙන් සැලකිය යුතු පිරිසක් මාස 03 ක කාලයක් දක්වා ආගන්තුක වීසා දිගුව ලබාගෙන ඇත.

**<u>කෙටිකාලීන සංචරන සඳහා පූර්ව ඉලෙක්ට්‍රොනික අනුමැතිය. (Electronic Travel Authorization.)</u>**

ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාව හරහා ගමන් කරන විදේශිකයන් උදෙසා අන්තර් ජාලය ඔස්සේ වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය සඳහා විද්‍යුත් සංචරන අනුමැතිය (Electronic Travel Authorization.) (ETA) ක්‍රියාත්මක කිරිම සඳහා අමා/11/1100/503/062 හා 2011.01.25 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලබාගන්නා ලදුව 2012.01.01 දින සිට එකී ක්‍රමවේදය ස්ථාපිත කරන ලදී.

2012 වසර තුල ETA යටතේ ලැබිය යුතු රාජ්‍ය ආදායම් රුපියල් මිලියන 2000 ක ලෙස ඇස්තමේන්තු ගත කල අතර 2012.12.31 දින වන විට මීට අදාලව රුපියල් මිලියන 2200 ක් ලෙස ඇස්තමේන්තු ආදායම ඉක්මවා වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.

මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මේ මගින් ශ්‍රී ලංකාවට විදේශිකයින්ගේ පැමිණීමේ අඩුවීමක් වියහැකි බවට විරෝධතා පලවූ නමුත් ශ්‍රී ලංකාවට විදේශිකයින් පැමිණීමේ ප්‍රතිශතය 2011 වසරට සාපේක්ෂව 2012 වසර තුල වැඩිවීම තුලින් අදාල තර්කය බිඳවැටී ඇත. තවද, මේ මගින් රටට ලැබෙන්නාවූ ආර්ථික ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන 2013 වසර සඳහා වූ අයවැය යෝජනා මගින් ETA ගාස්තුව ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් 5 කින් වැඩි කිරීමට යෝජනා කර 2013.01.01 සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

- **<u>මාර්ගස්ථ වීසා.</u>**

ශ්‍රී ලංකාව හරහා මගීන් වෙනත් රටකට ගමන් කිරිම සඳහා ලබාගන්නා වීසාවක් වන අතර, මුල් පැය 48 දක්වා නොමිලේ නිකුත් කරනු ලබයි. මෙය දින 07 ක් දක්වා නියමිත ගාස්තු ගෙවා ලබාගත හැක.

2012 වර්ෂයේ 44808 දෙනෙකු සඳහා මාර්ගස්ථ වීසා නිකුත් කර ඇත. ඉන්දුනීසියානු,පිලිපීන හා ඉන්දියානු ජාතිකයන් මාර්ගස්ථ වීසා බහුලව භාවිතා කරනු ලබයි.

- **<u>නේවාසික ආගන්තුක වීසා.</u>**

නේවාසික ආගන්තුක වීසාවක් දීර්ඝකාලීන වාස වීසාවක් වශයෙන් සලකනු ලබන අතර, විදේශ ආයෝජන වැඩි කරගැනීම, විද්වත් වෘත්තිකයන් මෙරටට ගෙන්වා ගැනීම වැනි කාර්යයන් සඳහා මෙම වීසාවන් නිකුත් කරනු ලබයි. 2012 වසරේ මෙම වීසා නිකුත් කිරීම් 11 ක් සහ දීර්ඝ කිරීම් 36 ක් සිදු කර ඇත.

- **<u>"මගේ සිහින නිවස" වීසා යෝජනා ක්‍රමය.</u>**

"මගේ සිහින නිවස" වීසා යෝජනා ක්‍රමය යටතේ විදේශිකයන්ට තම දිවියේ සැඳෑ සමය විවේක සුවයෙන් ගත කිරීමට අවස්ථාව සලසා දී ඇත. වයස අවුරුදු 55 සම්පූර්ණ විදේශිකයන්ට මේ සඳහා අයදුම් කලහැකි අතර, ඔවුන්ගේ නමින් ඇ.ඩො.15000/- ක ස්ථාවර තැන්පතුවක් පවත්වා ගෙන යායුතු අතර, මසකට ඇ.ඩො.15000/- ක මුදලක් ලංකාව වෙත ප්‍රේෂණය විය යුතුය. 2012 වසරේ මෙම වීසා නිකුත් කිරීම් 41 ක් සහ දීර්ඝ කිරීම් 95 ක් සිදු කර ඇත.

**නේවාසික වීසා නිකුත් කිරීම් හා දීර්ඝ කිරීම් - 2012.12.31.**

| අනු අංකය | කාණ්ඩය | එකතුව |
|---|---|---|
| **01** | පුරවැසි පනතේ ii යටතේ වීසාවලින් නිදහස් කිරීම් | **344** |
| **02** | වෙනත් | **2** |
| **03** | ද්විත්ව පුරවැසි | **659** |
| **04** | පුරවැසි පනතේ 5 2 යටතේ | **1276** |
| **05** | පෞද්ගලික අංශය සඳහා | **3995** |
| **06** | ශ්‍රී ලාංකිකයෙකුගේ විදේශ කලත්‍රයා සඳහා | **4674** |
| **07** | ලියාපදිංචි ඉන්දියානුවන් | **65** |
| **08** | රාජකාරී | **1442** |
| **09** | හිටපු ශ්‍රී ලාංකිකයන් සඳහා | **3545** |
| **10** | ශිෂ්‍ය හා ශිෂ්‍යත්වලාභීන් සඳහා | **5612** |
| **11** | වෛද්‍ය හේතු මත | **351** |
| **12** | නේවාසික ආගන්තුක වීසා | **44** |

| | | |
|---|---|---|
| 13 | ආයෝජන මණ්ඩල | 6289 |
| 14 | ආගමික කටයුතු | 995 |
| 15 | රාජ්‍ය අංශය සඳහා | 7978 |
| 16 | පූජ්‍ය පක්ෂය | 1188 |
| 17 | ශ්‍රී ලාංකිකයන්ගේ දරුවන් සඳහා | 341 |
| 18 | රාජ්‍යතාන්ත්‍රික | 538 |
| 19 | රාජ්‍ය නොවන සංවිධාන | 685 |
| 20 | මගේ සිහින නිවස ව්‍යාපෘතිය | 141 |
| 21 | උසාවියේ පෙනී සිටීම සඳහා | 145 |
| | එකතුව | 40309 |

## 4.1 තොටුපල කටයුතු.

i. 2012 ජුනි මස 06 වන දින මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ ආගමන හා විගමන කටයුතු ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් ලබාගනු ලැබූ ගොඩනැගිලිවල දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලය සමග සම්බන්ධ පරිගණක පද්ධතියකින් සහ අංග සම්පූර්ණ කාර්යාලීය උපකරණවලින් සමන්විත කාර්යාලයක් නිර්මාණය කරන ලදී. මෙම කාර්යාලය 2012.08.17 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. එහි රාජකාරියේ නිරත ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි සහ බලයලත් නිලධාරීන් සඳහා මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණයේ නිල නිවාසයක්ද වෙන් කර දෙන ලදී. 2012.11.09 දින සිට නාවිකයන් සඳහා වන පරිගණක ගත ගොඩ බැසීමේ අවසර පත්‍රය කොළඹ වරාය සහ ගාල්ල වරාය කේන්ද්‍ර කරගෙන නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

ii. 2012.11.09 දින සිට නාවිකයන් සඳහා වන පරිගණකගත ගොඩබැසීමේ අවසර පත්‍රය කොළඹ වරාය සහ ගාල්ල වරාය කේන්ද්‍ර කරගෙන නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

iii. ගුවන් තොටුපල හරහා පැමිණීමේදී හා පිටවීමේදී දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම දේශීය/විදේශීය මගීන්ගේ ගමන් බලපත්‍රවල පැමිණීම පිටසන් කරනු ලැබුවේ මුද්‍රාවක් මගිනි. 2012.07.01 දින සිට ඊට අමතරව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන අයුරින් ස්ටිකරයක් පිටසනට සමගාමීව යෙදීමට කටයුතු කරන ලදී.

iv. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය ඇතිව ජාත්‍යන්තර අධ්‍යයනයන් පිලිබඳ බණ්ඩාරනායක මධ්‍යස්ථානය මගින් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරින් හා බලයලත් නිලධාරීන් සඳහා සංක්‍රමණ අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් මේ වර්ෂය තුලදී සංවිධානය කොට නිලධාරීන් 21 දෙනෙක් සඳහා අවස්ථාව උදා කරදෙන ලදී. මීට අමතරව

බලයලත් නිලධාරීන් 100 දෙනෙකුට ශ්‍රී ලාංකික විදේශ ශ්‍රමිකයන් පිළිබඳ ප්‍රතිපත්ති, රෙගුලාසි හා නීත්‍යානුකූල සංක්‍රමණය පිළිබඳ එක් දින වැඩ මුළුවක් පවත්වන ලදී.

v. විදේශීය නාවික කාර්ය මණ්ඩලය ගොඩබැසීමේදී ගෙවිය යුතු රුපියල් 1000/- ක ගාස්තුව බැංකු හරහා ගෙවීම වෙනුවට කේතක ස්ටිකර් නිකුත් කිරීම මෙම වසරේදී ආරම්භ කරන ලදී.

**පැමිණීමේ හා පිටවීමේ තොරතුරු තොටුපල අනුව 2012**

| | තොටුපල | පැමිණි සංඛ්‍යාව | පිට වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල | 2493898 | 2546095 |
| 2 | රත්මලාන ගුවන් තොටුපල | 25 | 14 |
| 3 | කොළඹ වරාය | 7625 | 7930 |
| 4 | ගාල්ල වරාය | 18895 | 17290 |
| 5 | ත්‍රිකුණාමලය වරාය | 719 | 497 |
| 6 | හම්බන්තොට වරාය | 34 | 6 |
| 7 | නොරොච්චෝලෙ වරාය | 22 | 39 |
| | **එකතුව** | **2521218** | **2571871** |

**පැමිණීමේ හා පිටවීමේ සාමාන්‍ය තොරතුරු**

| | | පැමිණි | පිටවූ | එකතුව |
|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලාංකික පුරවැසියන් | 1210914 | 1268792 | 2479706 |
| 2. | විදේශිකයන් | 1310304 | 1303079 | 2613383 |
| | **එකතුව** | **2521218** | **2571871** | **5093089** |

## දිවයිනට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව මහාද්වීප අනුව වර්ගීකරණය -2012

| ශ්‍රී ලංකාවට පැමිණි මගීන් සංඛ්‍යාව - මහාද්වීප අනුව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| මාසය | අප්‍රිකාව | ඇන්ටාටික් | ආසියාව | ඕස්ට්‍රේලියාව | යුරෝපය | උතුරු ඇමරිකාව | දකුණු ඇමරිකාව | හදුනා නොගත් | එකතුව |
| ජනවාරි | 726 | 0 | 146417 | 5238 | 58566 | 6944 | 169 | 113 | 122948 |
| පෙබරවාරි | 798 | 0 | 131787 | 3798 | 61271 | 5397 | 133 | 79 | 115273 |
| මාර්තු | 938 | 0 | 153520 | 4292 | 57609 | 5956 | 184 | 114 | 121931 |
| අප්‍රේල් | 774 | 0 | 162383 | 4815 | 37500 | 5051 | 133 | 113 | 93490 |
| මැයි | 659 | 0 | 148572 | 3286 | 22365 | 5148 | 122 | 92 | 87623 |
| ජුනි | 802 | 1 | 159651 | 4829 | 25929 | 7837 | 143 | 101 | 99421 |
| ජුලි | 903 | 0 | 158120 | 5410 | 51765 | 8168 | 116 | 85 | 118713 |
| අගෝස්තු | 943 | 0 | 159256 | 4756 | 42416 | 6014 | 166 | 71 | 105170 |
| සැප්තැම්බර් | 1388 | 0 | 148213 | 5235 | 32520 | 4105 | 130 | 109 | 92873 |
| ඔක්තෝම්බර් | 1294 | 0 | 150899 | 4337 | 38714 | 5187 | 200 | 144 | 105862 |
| නොවැම්බර් | 905 | 0 | 144609 | 5339 | 40754 | 4998 | 174 | 76 | 104251 |
| දෙසැම්බර් | 1211 | 0 | 178861 | 12760 | 57064 | 9145 | 227 | 76 | 142749 |
| **එකතුව** | 11341 | 1 | 1842288 | 64095 | 526473 | 73950 | 1897 | 1173 | 1310304 |

## ඒ ඒ මාසය තුල පැමිණි හා පිටවූ මගීන් සංඛ්‍යාව - 2012

| මාසය | පැමිණි මගීන් | | | පිට වූ මගීන් | | |
|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශිකයින් | එකතුව | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශිකයින් | එකතුව |
| ජනවාරි | 95225 | 122948 | 218173 | 105801 | 142076 | 247877 |
| පෙබරවාරි | 87990 | 115273 | 203263 | 107896 | 115348 | 223244 |
| මාර්තු | 100682 | 121931 | 222613 | 100513 | 122243 | 222756 |
| අප්‍රේල් | 117279 | 93490 | 210769 | 112149 | 109273 | 221422 |
| මැයි | 92621 | 87623 | 180244 | 96450 | 87496 | 183946 |
| ජූනි | 99872 | 99421 | 199293 | 94774 | 88683 | 183457 |
| ජූලි | 105854 | 118713 | 224567 | 98867 | 104056 | 202923 |
| අගෝස්තු | 108452 | 105170 | 213622 | 128022 | 122341 | 250363 |
| සැප්තැම්බර් | 98827 | 92873 | 191700 | 116859 | 93734 | 210593 |
| ඔක්තෝබර් | 94913 | 105862 | 200775 | 104703 | 105460 | 210163 |
| නොවැම්බර් | 92604 | 104251 | 196855 | 94871 | 101540 | 196411 |
| දෙසැම්බර් | 116595 | 142749 | 259344 | 107887 | 110829 | 218716 |
| **එකතුව** | **1210914** | **1310304** | **2521218** | **1268792** | **1303079** | **2571871** |

## 4.2 විමර්ශන කටයුතු/විශේෂ විමර්ශන හා බුද්ධි නියාමන කටයුතු.

රටට අහිතකර පුද්ගලයින්ගේ පැමිණීම වැලැක්වීම, අයථා ලෙස රටතුල වීසා රෙගුලාසිවලට පටහැනිව රැඳී සිටින විදේශිකයන් පිලිබඳ තොරතුරු ලබාගනිමින් ඔවුන් අත්අඩංගුවට ගෙන රටින් පිටුවහල් කිරීම සඳහා විමර්ශන කටයුතු මෙහෙයවීම මෙම අංශය මගින් සිදුවේ. 2012 වසර තුල රටින් ඉවත් කල පුද්ගලයින්ගේ

සංඛ්‍යාව 499 ක් වන අතර මේ අතරේ බහුලව දක්නට ලැබෙන ජාතීන් වනුයේ ඉන්දියානු, පකිස්ථානු, ඇප්ගනිස්ථානු.නයිජීරියානු සහ චීන ජාතිකයින් වේ.

**2012 වර්ෂය තුල විමර්ශන කටයුතුවලට අදාල ප්‍රගතිය.**

| | අත්අඩංගුවට ගත් සංඛ්‍යාව | වීසා කල් ඉකුත් වූ | වීසා අවභාවිතාව | රටින් ඉවත් කල | රටින් පිටවීමට අවසර දුන් | මුදා හල සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | 511 | 23 | 488 | 499 | 04 | 08 |

- **රැඳවුම් කඳවුරු.**

මිරිහාන රැඳවුම් කඳවුරේ අළුත්වැඩියා කටයුතු 2012.07.18 දින නිම කරන ලදී. කාන්තා හා පිරිමි රැඳවියන් සඳහා වෙන් වෙන් වශයෙන් පහසුකම් සපයා ඇති අතර, ඔවුන්ගේ විනෝද කටයුතු සඳහා රූපවාහිනි යන්ත්‍ර 02 ක්ද සපයා ඇත. රැඳවියන්ගේ ගමනාන්තය සඳහා ගුවන් ගමන් බලපත්‍ර කඩිනමින් ලබාගෙන ඔවුන්ව පිටත් කිරීමේ වැඩ පිළිවෙලක් 2012 වසරේ සිට ක්‍රියාත්මක කරන ලදී.

**2012 වසර තුල රැඳවුම් කඳවුරට ඇතුලත් කල සංඛ්‍යාව**

| | |
|---|---|
| බලයලත් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් සංඛ්‍යාව | 04 |
| බන්ධනාගාර නිලධාරීන් විසින් භාරදුන් සංඛ්‍යාව | 194 |
| පොලිස් නිලධාරීන් විසින් භාරදුන් සංඛ්‍යාව | 11 |
| **එකතුව** | **209** |

**2012 වසර තුල රැඳවුම් කඳවුරුවලට ඇතුලත් කල සංඛ්‍යාව (ජාතීන් අනුව).**

| අනු අංකය | ජාතිය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඉන්දියානු | 35 |
| 02 | ඇෆ්ගනිස්ථානු | 08 |
| 03 | පකිස්තානු | 01 |

| | | |
|---|---|---|
| 04 | චීන | 29 |
| 05 | ඇමෙරිකානු | 02 |
| 06 | සෝමාලියානු | 04 |
| 07 | ඉරාන් | 03 |
| 08 | බංගලිදේශ | 01 |
| 09 | තුර්කි | 02 |
| 10 | මාල දිවයින් | 02 |
| 11 | ජර්මන් | 02 |
| 12 | බ්‍රිතාන්‍ය | 02 |
| 13 | නයිජීරියානු | 12 |
| 14 | එරිත්‍රියන | 01 |
| 15 | සිරියන් | 05 |
| 16 | ඉන්දුනීසියානු | 01 |
| 17 | ස්වීඩන් | 01 |
| 18 | ලයිබේරියානු | 01 |
| 19 | තායිවාන් | 96 |
| 20 | ගිනියා | 01 |
| | **එකතුව** | **209** |

**2012.12.31 දිනට රැඳවුම් කඳවුරේ රඳවා සිටි සංඛ්‍යාව -20**

- <u>**සරණාගත අපේක්ෂක (UNHCR) තත්වය.**</u>

2006 වර්ෂයේ ජුනි 01 වන දින එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සමග ශ්‍රී ලංකාව අත්සන් කල ගිවිසුම පරිදි තෙවන රටක සරණාගත තත්වය අපේක්ෂා කරන තැනැත්තන්ට ශ්‍රී ලංකාවට පැමිණ එහි සිට වෙනත් රටක සරණාගත තත්වය ලබාගෙන ශ්‍රී ලංකාවෙන් බැහැර වනතෙක් රැඳී සිටීමට ඉඩකඩ සැලසී ඇත. මෙම ක්‍රමය යටතේ 2012.12.31 දින වන විට ශ්‍රී ලංකාව තුල රැඳී සිටි සරණාගත හා සරණාගත

අපේක්ෂක විදේශිකයන් සංඛ්‍යාව 399 කි. මෙයින් වැඩි පිරිසක් වනුයේ පකිස්ථානු ජාතිකයන්ය. ඉන් අනතුරුව මාල දිවයින් ජාතිකයින් හා ඇෆ්ගන් ජාතිකයන්ද සරණාගත තත්වය සඳහා ඉල්ලුම් කර ඇත.

## 4.3 ජාත්‍යන්තර සහයෝගිතා අංශයට අදාල කටයුතු

පහත කරුණු සඳහා නව ඒකක 05 ක් ස්ථාපිත කිරීම තුළින් ප්‍රත්‍යන්ත පාලනය විධිමත් කිරීමට පියවර ගෙන ඇත. ඒවා නම්,

### i. සංක්‍රමණිකයන් පිළිබඳ බුද්ධි අංශය.

සංක්‍රමණිකයන් පිළිබඳ දත්ත රැස්කිරීමට සහ ඒවා විශ්ලේෂණය කිරීමට මෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශයන් හි ඇති දත්තයන් රැස්කිරීමට හා අනාගතයට සුදුසු ආකාරයෙන් භාවිතා කිරීම සඳහා එම තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා සංක්‍රමණික තොරතුරු කේන්ද්‍රයක්ද .(MIU) ස්ථාපිත කර ඇත.

### ii. අස්ථානගතවූ හා හානි වූ ගමන් බලපත්‍ර අංශය.

නැතිවූ හෝසොරකම් කරන ලද ගමන් බලපත් පිළිබඳ පොලිස් තොරතුරු කේන්ද්‍රය මඟින් ලබාදෙන තොරතුරු පද්ධතිගත කොට එම තොරතුරු ජාත්‍යන්තර පොලීසිය වෙත ලබාදීම වෙබ් අඩවියක් .(SLTD) මඟින් සිදුකරයිමෙහිදී නැතිවූ හෝ සොරකම් කරන ලද විදේශ ගමන් බලපත්‍රයක් මඟින් වෙනත් පුද්ගලයෙකු විදේශ ගතවීම නැවැත්වීමට පියවර ගෙන ඇති අතර නීති විරෝධී කටයුතු සිදුවීම වැලැක්විම මෙහි අරමුණයි.

### iii. නැවත භාරගැනීමේ අවස්ථා කළමණාකරණ ඒකකය.

පිටුවහල් කල ශ්‍රී ලාංකිකයන්ට ඒම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් විදේශ ගමන් බලපත් නිකුත් කිරීමට මෙතෙක් නොවූ නව ක්‍රමවේදයන් සකස් කර ඇත. එමගින් ඔවුන් සඳහා විදේශ ගමන් බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කර ඇති අතර එම තොරතුරු පද්ධතිගත කිරීමද සිදුවේ.

### iv. ඒකාබද්ධ තොරතුරු කළමණාකරණ ඒකකය.

දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ආයතනවලට විදේශ ගමන් බලපත් පිළිබඳ තොරතුරු අවශ්‍ය වූ විට ලබාදීමට වෙනම අංශයක් (IEMS) ස්ථාපනය කරන ලදී. විදේශ තානාපති කාර්යාලයන් සෘජුව සම්බන්ධකම් පවත්වන්නේ මෙම අංශය සමග වන අතර අවශ්‍ය විටකදී වීසා නිකුත් කිරීමට පෙර විදේශ ගමන් බලපත් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කරගැනිම මෙම අංශය හරහා කරගනු ලබයි.

### v. නැවත භාරගැනීම් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව.

විදේශ රටවල සිට පිටුවහල් කරන්නන් නැවත ගෙන්වා ගැනීම සඳහා ජාතික සම්බන්ධීකාරක කමිටුවක් (NCCR) ස්ථාපිත කර ඇත. දේශපාලන හෝ වෙනත් හේතූන් මත රැකවරණය ලබා සිටි ශ්‍රී ලාංකිකයන් නැවත ශ්‍රී ලංකාවට පිටුවහල් කරන අවස්ථාවලදී ඒ හා අදාල ගිවිසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම හා ඒම ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

## 05. ගමන් බලපත් නිකුත් කිරීම්.

- **ප්‍රධාන කාර්යාලය.**

ගමන් බලපත් අංශය මෙම දෙපාර්තමේන්තුවේ සේවය ලබාගැනීමට මහජනයා වැඩිපුරම පැමිණෙන අංශය වේ. ගමන් බලපත් ලබාගැනීම, අළුත් කිරීම හා ඒවායේ විවිධ සංශෝධන සඳහා ප්‍රධාන කාර්යාලයට අමතරව ප්‍රාදේශීය කාර්යාල 03 ක් පිහිටුවා ඇත. 2012 වසරේ 02 වන මස 08 දින ඒවකට අනුරාධපුර තිබූ ප්‍රාදේශීය කාර්යාලය වවුනියාවේ ස්ථාපිත කිරීමට පියවර ගත්තේ උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත්වල මහජනතාවට වඩා කාර්යක්ෂම සේවයක් ලබාදීමේ අරමුණින් යුතුවයි.

මහජන සේවය දිනෙන් දින කාර්යක්ෂමව හා සුහදශීලිව වගකීමෙන් ඉටුකල යුතුය යන දර්ශනයට අනුව අවුරුදු 16 ට අඩු ළමුන් සඳහා නිකුත් කරන ගමන් බලපත්‍රයේ වෙනසක් 2012.09.01 දින සිට සිදු කිරිමට පියවර ගත්තෙමි. සාමාන්‍යයෙන් ගමන් බලපත්‍රයක් නිකුත් කරන්නේ අවුරුදු 10 ක වලංගු කාලයක් සඳහාය. අවුරුදු 16 ට අඩු ළමුන් සඳහා එසේ නිකුත් කරන ගමන් බලපත්‍ර අවුරුදු 03 හෝ 04 පමණ කාලයක්වත් භාවිතා කල නොහැකි බව පෙනී ගියේය. එයට හේතුව ළමුන් වර්ධනය වීමේදී බාහිර පෙනුම විශාල වශයෙන් වෙනස් වන බැවින් ඔවුනට එම ගමන් බලපත්‍ර භාවිතා කිරීමේදී ගැටළු ඇතිවන බැවිනි. එබැවින් අවුරුදු 16 ට අඩු ළමුන් සඳහා ඔවුන්ගේ මනාපය පරිදි වලංගු කාලය අවුරුදු 03 කට සීමා කල ගමන් බලපත්‍රයක් අඩු ගාස්තුවකට නිකුත් කිරිමට පියවර ගන්නා ලදී. කෙසේ වුවද අවශ්‍යතාවය අනුව අවුරුදු 10 ක වලංගු කාලයක් සඳහාද ගමන් බලපත්‍ර නිකුත් කිරීමටද ඉඩකඩ සලසා ඇත. මෙම වෙනස් කල ක්‍රමවේදය මහජනතාවට ප්‍රයෝජනවත් වී ඇති බව 2012 ඔක්තෝම්බර් සිට ගතවූ මාස 03 තුල වසර 03 ක වලංගු කාලයක් සඳහා ගමන් බලපත්‍ර ලබාගත් සංඛ්‍යාව පරීක්ෂා කිරීමේදී පෙනී යයි. මෙම දින 90 ක කාලය තුල වලංගු කාලය අවුරුදු තුන වන සියළුම රටවල් සඳහා ගමන් බලපත් 8995 ක්ද, විශේෂිත රටවල් සඳහා 2496 ක්ද නිකුත් වී ඇත.

ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රය නූතන තාක්ෂණයට ගලපමින් ජෛවමිතික ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමේ අදහස දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලදුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලැබූ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම මත ඕස්ට්‍රේලියානු රජයේ ආධාර මගින් ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිතය. මීට අදාලව ක්‍රම අධ්‍යයනයක් සිදුකොට අවශ්‍ය ක්‍රමවේද තීරණය කිරීම මේ වන විට අවසාන වී ඇත. ඒ අනුව 2014 වර්ෂයේ මැද භාගයේදී පමණ ජෛවමිතික ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමට හැකිවේ යැයි අපේක්ෂා කරනු ලැබේ.

## ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර නිකුත් කිරීම - 2012

| | ගමන් බලපත් වර්ගය | නිකුත් කළ ගණන |
|---|---|---|
| 1. | සියලු රටවල් සඳහා වලංගු ගමන් බලපත් | 302849 |
| 2. | මැදපෙරදිග රටවල් සඳහා වලංගු ගමන් බලපත් | 230857 |
| 3. | රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත් | 287 |
| 4. | හදිසි සහතික | 35826 |
| 5. | හඳුනාගැනීමේ සහතික | 5 |
| 6. | රාජකාරී ගමන් බලපත් | 901 |
| | **එකතුව** | **570725** |

**ශ්‍රී ලංකා ගමන් බලපත් අලුත් කිරීම් හා වෙනස් කිරීම් 2012**

| වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| අලුත් කිරීම් හා වෙනස් කිරීම් | 127057 |

## 5.1 විදේශ දූත මණ්ඩල අංශය.

විදේශ දූත මණ්ඩල මගින් එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ ගමන් බලපත්‍ර අයදුම් පත් මාගේ කාර්යාලයේ විදේශ දූත මණ්ඩල අංශයට යොමු කරයි. ඒ අනුව 2012 වසරේදී සේවාලාභීන් 36691 ක් වෙනුවෙන් සේවය කිරීමට අවස්ථාව ලැබී ඇත. 2012 වසර තුලදී ශ්‍රී ලංකා ආණ්ඩුවේ 2011.12.22 දින ගත් කැබිනට් තීරණය පරිදි, ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ සිටින ශ්‍රී ලාංකික සරණාගතයින් 90,000 කට ආසන්න සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේදී ඔවුනට ගාස්තු අයකිරීමෙන් තොරව ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලැබුනු අතර, ඒ අනුව ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ සරණාගත කඳවුරුවල හා තමන් විසින් සොයා ගන්නා ලද පෞද්ගලික වාසස්ථානවල ජීවත් වන ශ්‍රී ලාංකික සරණාගතයින් හට වෙන්නායි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස්

නිර්දේශය මත කිසිදු ගාස්තුවක් අය කිරීමෙන් තොරව ශ්‍රී ලංකාවට පැමිණීමට පමණක් වලංගු ගමන් බලපත්‍ර 1024 ක් 2012 වසරේදී නිකුත් කරන ලදී.

- **<u>ප්‍රාදේශීය කාර්යාල.</u>**

අනුරාධපුර පැවති ප්‍රාදේශීය කාර්යාලය 2012 වසරේදී වවුනියාවට රැගෙන යෑම සිදුකරන ලද අතර, මහනුවර ප්‍රාදේශීය කාර්යාලය මගින් ගමන් බලපත්‍ර 51545 ක්ද, මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් ගමන් බලපත්‍ර 33893 ක්ද වවුනියාව කාර්යාලය මගින් ගමන් බලපත්‍ර 23712 ක්ද නිකුත් වී ඇත.

- **<u>ගමන් බලපත් අළුත් කිරීම් අංශය.</u>**

ගමන් බලපත්‍ර වල සිදු කෙරෙන සංශෝධනයන් සංඛ්‍යාව 2012 වසරේ සිට ක්‍රමයෙන් අඩු වී යන බව පෙනී යයි. එයට හේතු වන්නේ විශේෂිත රටවල ගමන් බලපත්‍ර සියළු රටවල් සඳහා සංශෝධනය කිරීම 2012 වසරේ සිට අත්හිටුවීම සහ 2006 වසරේ සිට අවුරුදු 10 සඳහා වලංගු ගමන් බලපත්‍ර නිකුත් කිරීමට ගත් තීරණයයි.

## 06. <u>පුරවැසි අංශය.</u>

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන රාජකාරී යටතට වැටෙන රාජකාරී අතර පුරවැසි අංශය විසින් ඉටු කරන රාජකාරිද ඉතා වැදගත් තැනක් උසුලුයි. මෙහි රාජකාරී අතර ප්‍රධාන තැනක් උසුලන්නේ පුරවැසිභාවය පිළිබඳ පනතේ 5(2) වගන්තිය යටතේ ශ්‍රී ලාංකික මවකට හෝ පියකුට දාව විදේශීය රටකදී උපදින දරුවන්ගේ උපත් ලියා පදිංචියයි.

**i. විදේශ රටවලදී ශ්‍රී ලාංකික දෙමව්පියන්ටත් දාව උපදින දරුවන්ගේ උපත් ලියා පදිංචිය පුරවැසි පනතේ 5(2) වගන්තිය යටතේ**

මේ යටතේ 2003 වසරට පෙර ශ්‍රී ලාංකික පුරවැසිභාවය සඳහා අයදුම්කල හැකිව තිබුණේ ශ්‍රී ලාංකික පියෙකුට දාව විදේශයකදී උපදින දරුවන් හට පමණි.

නමුත් 2003 අංක 16 දරණ සංශෝධන පනත මගින් පුරවැසි පනතට සිදු කරන ලද සංශෝධනයද සමඟ එක්තරා අයුරකින් අපහසුතාවයට පත්ව සිටි විදේශික ස්වාමිපුරුෂයින්ට දාව විදේශගතව දරුවන් බිහිකළ ශ්‍රී ලාංකික මව්වරුන්ට තම පුරවැසිභාවය පදනම්කොට ගනිමින් දරුවන් ලියා පදිංචි කිරීමේ හැකියාව උදාවිය. නමුත් ඒ සඳහා හඳුන්වා දී තිබූ අයදුම්පත්‍රය පියාගේ හා පිය පාර්ශවයේ තොරතුරු ලබා ගැනීමට පමණක් මූලිකවම පදනම්වී තිබුණ නිසා, 2003 වසරේ පනතට කළ සංශෝධනය සමඟ මව් පාර්ශවයේ තොරතුරු ඇතුලත් කිරීමට එහි ප්‍රමාණවත් ඉඩක් නොතිබුණි. ඒ අනුව, මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට මේ වසරේදී අපට හැකි විය.

විශේෂයෙන්ම 5(2) වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතික එම දරුවන්ගේ දෙමව්පියන් වෙත ලැබීමේ ගැටළු පවතින බව කාලයක් තිස්සේ නිරීක්ෂණය වූ නිසා එයද වඩාත් පහසුකරමින් අයදුම්පත්‍රය සංශෝධනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සූදානම් කෙරුණි. ඒ අනුව තම සහතික පත්‍රය ගෙන්වා ගැනීමේ ක්‍රමවේදය තීරණය කිරීමට අයදුම්කාර පාර්ශවයට ඉඩ සැලසීම නව අයදුම්පත්‍රයේ සුවිශේෂී ලක්ෂණයක් විය.

ඒ අනුව සිදු වූ වෙනස්කම නිසා විදේශයන්හි පිහිටි තානාපති කාර්යාලවලට සහතික පත්‍ර රාජ්‍යතාන්ත්‍රික තැපැල මගින් යැවූ ක්‍රමවේදය වෙනුවට අයදුම්කරුවන්ගේ මනාපය පරිදි තමන්ගේ විදේශීය ලිපිනයට හෝ තමන්ගේ

දේශීය ලිපිනයට අදාල තැපැල් ගාස්තු ගෙවීම සිදුකර සහතිකය ගෙන්වා ගැනීමේ ඉඩකඩ සලසන ලදී. පසුගිය කාලය පුරාවට විදේශීය තානාපති කාර්යාල තුල සහතික පත් ගොඩ ගැසී තිබූ අතර, එම සහතිකපත් ලබා ගැනීමට තානාපති කාර්යාලවලට පැමිණීමේ අපහසුතාවය හා නොහැකියාව නිසා ගැටළු රාශියකට මැදි වී සිටි අයදුම්කරුවන් විශාල ප්‍රමාණයකට මින් සහනයක් සැලසේ. මෙහිදී සහතිකය අයදුම්කරුවන්ගේ දේශීය හෝ විදේශීය ලිපිනයට තැපැල් කිරීම වෙනුවෙන් රුපියල් 300.00 ක උපරිමයකට යටත්ව ගාස්තු අය කිරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

## 6.1 ද්විත්ව පුරවැසිභාවය

පුරවැසි අංශයේ ක්‍රියාත්මක වන අනෙකුත් සියළු කර්තව්‍යයන් අතර ද්විත්ව පුරවැසිභාවය ලබාදීම පුරවැසි පනතේ 19(2) හා 19(3) වගන්ති යටතේ වැදගත් තැනක් උසුලයි. නමුත් 2011 ජනවාරි මස 28 වන දින ද්විත්ව පුරවැසිභාවය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටවූ නිසා ඒ වන විට ලැබී තිබුණු, මුදල් ගෙවා අවසන් කර තිබූ සහතිකපත් ලබාදීම පමණක් මේ කාලය තුල සිදු වූ අතර පැවති ක්‍රමය වෙනුවට නව ක්‍රමවේදයක් හඳුන්වා දීමේ මූලික කටයුතු සිදු කිරීම මෙම වර්ෂයේදී සිදුවිණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් මෙම නව ක්‍රමවේදය **" එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයෝ"** යන නමින් ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. එම අනුමැතිය මත මෙම නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා වන නීති කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත දන්වා යවන ලදුව දැනට නීති සකස් වෙමින් පවතී.

## 6.2 අනෙකුත් වගන්ති යටතේ වන රාජකාරී

i. 8,11,12 වන වගන්ති යටතේ අයදුම්පත් 70 කට ආසන්න ප්‍රමාණයක් ලැබී තිබුණු අතර, එයින් සහතිකපත් 35 කට වඩා වැඩි ප්‍රමාණයක් නිකුත් කිරීමට හැකියාව ලැබුණි.

ii. පනතේ 13අ වැනි වගන්තිය යටතේ කටයුතු ඉටු කිරීම මීට පෙර ආරම්භ කර තිබුණද පසුගිය වර්ෂ කීපය තුලදී එහි ප්‍රගතියක් දක්නට නොලැබුණි. නමුත් මෙම වසරේ පුරවැසි පනතේ 13 අ වගන්තිය යටතේ එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබාදීමට හැකිවිය.

iii. එසේම 19(1) වගන්තිය යටතේ පුරවැසි භාවය අවසන් කිරීමේ කටයුතු මීට පෙර විධිමත්ව ක්‍රියාත්මක නොවුණි. ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය මත පුරවැසි භාවය අවසන් කිරීමේ කටයුතු සඳහා නිශ්චිත ක්‍රමවේදයක් ඇති කිරීමටද හැකි විය.

iv. ඉහත අයුරින් ව්‍යවස්ථාපිතව පැවරී ඇති රාජකාරී ඉටු කරන අතරතුරදී පුරවැසි පනතේ 5(2) වගන්තිය යටතේ දත්ත පද්ධතියට ඇතුළු කිරීමට නොහැකි වී තිබුණු පැරණි අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළු කිරීමේ වැඩසටහනක් 2012 වර්ෂයේදී ආරම්භ කිරීමට හැකි විය. වර්ෂය මැදදී ආරම්භ වූ වැඩසටහන් වර්ෂය ඉදිරි කාලය පුරාම සිදු වූ අතර එයින් දත්ත 18,118 ක් දත්ත පද්ධතියට ඇතුළු කිරීමට හැකි විය.

v. 5(2) වගන්තිය යටතේ ලැබී තිබුණු අඩුපාඩු සහිත ලිපිගොනු අවසන් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමද මෙම වසරේදී සිදු විය. ඒ අනුව එම ලිපි ගොනු වලට අදාල අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට එම අයදුම්කරුවන්ගේ ශ්‍රී ලාංකික ලිපිනයන්ට තැපැල්පත් දහසක පමණ ප්‍රමාණයක් යැවූ අතර පැවති අඩුපාඩු සම්පූර්ණ කර සහතික පත් ලබා දීමට හැකිවිය.

## 07. ඉන්දු ලංකා පුරවැසි අංශය.

ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ මෙම අංශය පිහිටුවා ඇත. මේ වනවිට මෙම අංශයේ කටයුතු 1988 අංක 39 හා 2003 අංක 35 දරණ පනත් යටතේ පුරවැසිභාවය තහවුරු කිරීමේ සහතික නිකුත් කිරීමට සීමා වී ඇත. පසුගිය වර්ෂ කීපයක සංඛ්‍යා ලේඛන දෙස බලන විට පෙනීයන්නේ ඒ අන්දමට පුරවැසි සහතික ඉල්ලුම් කරන්නන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස පහත වැටී ඇති බවයි. 1988 අංක 39 හා 2003 අංක 35 පනත් යටතේ පුරවැසි බව හිමි වන ආකාරය පිළිබඳ අවබෝධයක් 2007/2008 වර්ෂ වලදී මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් සියලුම ග්‍රාම නිලධාරීන් වෙත ලබා දෙන ලදි. ඒ අනුව ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන් ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පැවති ගැටළු බොහෝ දුරට මග හැරී ඇත. 2011 වර්ෂයේදී නිකුත් කළ අංක 2011/11 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින්ද ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසි බව හිමි වන ආකාරය පිළිබඳව පැහැදිලි උපදෙස් සියලුම රාජ්‍ය නිලධාරීන් වෙත ලබා දී ඇත. පුරවැසි සහතික සඳහා ඉල්ලුම අඩුවීමට ඉහත සඳහන් කළ කරුණු යම් දුරකට බලපා ඇති බව පෙනේ. තවද සැලකිය යුතු පිරිසක් තමන් පරම්පරාවෙන් ශ්‍රී ලංකා පුරවැසියන්ව සිටිමින් ඒ බව නොදැන ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසි බව ප්‍රදානය කිරීමට අදාල නීති යටතේ පුරවැසි සහතික සඳහා අයදුම් කරන බවද දක්නට ලැබේ. එබඳු අවස්ථාවලදී අදාල තැනැත්තන් පරම්පරාවෙන් ශ්‍රී ලංකා පුරවැසි බවට හිමිකම් ලබා ඇති ආකාරය පැහැදිලි කොට දැනුම් දීමට මෙම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත.

2012.12.31 දින වන විට 1988 අංක 39 දරණ පනත යටතේ පුරවැසි සහතික 43817 ක්ද, 2003 අංක 35 දරණ පනත යටතේ පුරවැසි සහතික 579 ක්ද නිකුත් කොට ඇත. 2012 වර්ෂය තුල නිකුත් කළ පුරවැසි සහතික පිළිබඳ සංඛ්‍යා ලේඛන පහත වගුවේ දැක්වේ.

### පුරවැසි සහතික නිකුත් කිරීම.

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| (1) 1988 අංක 39 | 475 | 172 | 106 | 71 | 14 |
| (2) 2003 අංක 35 | 107 | 24 | 61 | 04 | 08 |
| (3) 2008 අංක 38 | -- | 76 | 08 | 04 | 01 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (4) | 2003 අංක 35 පනත යටතේ දැනුම් දීමේ ලිපි නිකුත් කිරීම | 88 | 57 | 23 | 13 | -- |

## 7.1 චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසි බව ප්‍රදානය කිරීම.

2008 අංක 38 දරණ පනත යටතේ චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසි බව ප්‍රදානය කරනු ලැබේ. මෙම පනතේ වලංගු කාලය 2013.10.30 දිනට අවසාන වීමට නියමිතය. මෙම පනත යටතේ 2012.12.31 දින වනවිට පුද්ගලයන් 89 දෙනකුට ශ්‍රී ලංකාවේ පුරවැසි බව ප්‍රදානය කොට ඇත. 2012 වර්ෂය තුල මේ යටතේ ලියාපදිංචි කළ පුරවැසියන් සංඛ්‍යාව 01 කි.

## 08. සුභ සාධක සංගමයේ කටයුතු.

දහසක පමණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකත්වයකින් යුත් ආගමන හා විගමන සුභසාධක සංගමය, සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයගේ සහ පොදුවේ මුළුමහත් සමාජයේ සුභසිද්ධිය උදෙසා ආගමික, සමාජීය හා සංස්කෘතිමය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුලින් කායික හා මානසික නිරෝගීමත් සේවක පිරිසක් බිහිකරමින්, ඔවුන්ගේ කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාව තුලින් මහජනතාවට වඩාත් ගුනාත්මක සේවයක් ලබාදීම අරමුණයි.

**ඒ සඳහා 2012 වර්ෂය තුල පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල යෙදී ඇත.**

1. 2012.01.02 දින නව අවුරුදු නිල උත්සවය හා දෙපාර්තමේන්තුවේ සියළුම සේවාවන් නියෝජනය වන පරිදි එක් අයකු බැගින් තෝරා ඇගයීම් තිළිණ ප්‍රදානය.

   මේ සමගම දෙපාර්තමේන්තුවේ සේවාවන් හා සම්බන්ධ බාහිර ආයතනවල නිලධාරීන්ද ඇගයීමට ලක්කර තිළිණ ප්‍රදානය කරන ලදී.

2. 2012.05.03 කැළණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන ස්වාමීන් වහන්සේ විසින් වෙසක් ධර්ම දේශනාව පවත්වන ලදී.

3. 2012.05.12 වන දින බොරැල්ල වෙස්ලි විදුහල් ක්‍රිඩාංගනයේදී දෙපාර්තමේන්තුවේ සේවය කරන මහත්ම මහත්මීන් හා පවුල්වල සාමාජිකයින් 2500 ක් පමණ දෙනාගේ සහභාගීත්වයෙන් වාර්ෂික සුහද හමුව අති සාර්ථකව පවත්වන ලදී.

4. 2012.05.19 දින ජන මාධ්‍ය අමාත්‍යාංශය සමග කෝට්ටේ, අංගම්පිටිය ක්‍රීඩාංගනයේදී පැවැත්වූ ක්‍රිකට් තරඟාවලියේ ජයග්‍රහණය දෙපාර්තමේන්තු කණ්ඩායම සතුවිය.

5. 2012 ජුනි මස 04 වන දිනට යෙදී ඇති පොසොන් පොහොය නිමිති කොට 2012.05.31 වන දින කොළඹ 10, පන්සල්වත්ත, ශ්‍රී බෞද්ධාරාම විහාරාධිපති සද්ධම්ම කීර්ති ශෝභමානි ලුණුගම්වෙහෙරේ විමලානන්ද ස්වාමීන් වහන්සේ වෙත රු. 100,000/- ක් වටිනා බෞද්ධ ධර්ම පුස්තක (ධර්ම ග්‍රන්ථ) හා පුස්තක තැන්පත් කිරීම සඳහා කබඩ් 01 ක් පූජා කිරීම.

6. 2012.06.16 වන දින දෙමටගොඩ දුම්රිය ක්‍රීඩාංගනයේදී කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් සය සාමාජික ක්‍රිකට් තරඟාවලියක් පවත්වන ලදී. මේ සඳහා දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන් නියෝජනය කරමින් කණ්ඩායම් ඉදිරිපත් වන ලදී.

7. 2012.06.28 වන දින නවලෝක රෝහල සමග එක්ව පූර්ණ වෛද්‍ය පරීක්ෂණයක් සංවිධානය කරන ලදී. විශේෂයෙන්ම මෙම පරීක්ෂණවලට සහභාගී වූවන්ට පිලිකාවන් සඳහා පරීක්ෂාවන්ට ඉදිරිපත්වීමේ අවස්ථාව ලබාදෙන ලදී.

8. 2012.07.19 වන දින සමෘද්ධි අමාත්‍යාංශය සමග කෝට්ටේ බණ්ඩාරනායක පුර ක්‍රීඩාංගනයේ පැවැති ක්‍රිකට් තරඟාවලියේ ජයග්‍රහනයද දෙපාර්තමේන්තුව සතු විය.

9. 2012.07.24 වන දින වාර්ෂික ලේ දන් දීමේ වැඩ සටහන මධ්‍යම ලේ බැංකුවේ අනුග්‍රහයෙන් සාර්ථකව පවත්වන ලදී. මෙහිදී ලේ පයින්ට් 93 ක් ලේ බැංකුව වෙත ලබාදීමට හැකියාව ලැබුනි.

10. 2012.07.31 වන දින කඳුබොඩ භාවනා මධ්‍යස්ථානය අබලන් තත්වයේ පැවති විදේශීය කාන්තා භාවනා කුටි රුපියල් ලක්ෂ 06 ක පමණ මුදලකින් ප්‍රතිසංස්කරණය කොට නැවත පූජා කිරීමේ උත්සවය පවත්වන ලදී.

11. 2012.08.05 වන දින දෙමටගොඩ දුම්රිය ක්‍රීඩාංගනයේදී කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් ක්‍රිකට් තරඟාවලියක් පවත්වන ලදී. මේ සඳහා දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන් නියෝජනය කරමින් කණ්ඩායම් ඉදිරිපත් වන ලදී.

12. 2012.09.27 දින **"නාදරමණී"** ආනන්දනීය ගීත සැඳෑව කොළඹ මියුසියස් විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ගරු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අති සාර්ථකව පවත්වන ලදී. රුපියල් ලක්ෂ 4,647,452/- ක මුදලක් සංගමයේ අරමුදලට එක්කර ගැනීමට හැකියාව ලැබුනි.

13. 2012.12.20 නත්තල් උත්සවය නිමිති කොට ගෙන අඩු ආදායම්ලාභී දරුවන් සඳහා **"බිළිඳු හදට නත්තලක්"** වැඩ සටහන පවත්වන ලදී. මෙමගින් දරුවන් සඳහා ත්‍යාග පිරිනමන ලදී. මෙම වැඩ සටහන සඳහා සෑම වසරක මෙන් නලින් පෙරේරා ප්‍රමුඛ මේරියන්ස් සංගීත කණ්ඩායම නත්තල් කැරොල් ගී ගායනයට සම්බන්ධ වන ලදී.

14. 2012.12.28 දින වාර්ෂිකව පවත්වන පැදුරු සාජ්ජය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ හා පවුල්වල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

15. 2012.12.31 වන දින 2012 වර්ෂයේ විශ්‍රාම ගිය හා ස්ථාන මාරුවී යන නිලධාරීන් වෙනුවෙන් සංගමය වෙනුවෙන් පවත්වන ලද තිළිණ ප්‍රදානය කිරීමේ උත්සවය පවත්වන ලදී.

ඇමුණුම - 01

මූල්‍ය ප්‍රගතිය - 2012
වසර.

වැඩසටහන - 01
ව්‍යාපෘතිය - 01 සහ 02 සාමාන්‍ය පරිපාලනය හා ආගමන පාලනය හා
පුරවැසිභාවය.
වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා 2012 වර්ෂයේදී ව්‍යාපෘති දෙකක් යටතේ මූල්‍ය ප්‍රතිපාදන සලසා දී ඇත. ව්‍යාපෘති දෙකෙහි මුළු කාර්ය සාධනය ප්‍රාග්ධන වියදම් සඳහා 98% ක් වන අතර පුනරාවර්තන වියදම් සඳහා 98% ක් වේ.

| වියදම් වර්ගීකරණය | මුළු ඇස්තමේන්තුව | සත්‍ය වියදම් | ඉතිරිවීම් | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | |
| පෞද්ගලික පඩිනඩි සහ දීමනා | 32,75,00,000 | 32,37,71,802 | 37,28,198 | 99 |
| ගමන් වියදම් | 1,88,00,000 | 1,81,32,476 | 6,67,524 | 96 |
| සැපයීම් | 2,24,50,000 | 2,16,03,833 | 8,46,167 | 96 |
| නඩත්තු වියදම් | 8,99,50,000 | 8,74,79,184 | 24,70,816 | 97 |
| ගිවිසුම්ගත සේවා | 14,27,10,000 | 14,10,39,368 | 16,70,632 | 99 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 66,40,000 | 66,28,877 | 11,123 | 100 |
| **එකතුව** | 60,80,50,000 | 59,86,55,540 | 93,94,460 | |
| **ප්‍රාග්ධන වත්කම්** | | | | |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | | | | |
| 2001- ගොඩනැගිලි හා සවිකිරීම් | 42,00,000 | 32,59,731 | 9,40,269 | 78 |
| 2002- යන්ත්‍රෝපකරණ | 1,01,20,000 | 1,01,13,315 | 6,685 | 100 |
| 2003- වාහන | 11,00,000 | 10,70,989 | 29,011 | 97 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | | | | |
| 2101- වාහන | 6,00,000 | 5,20,000 | 80,000 | 87 |
| 2102- ලීබඩු හා කාර්යාල උපකරණ | 25,00,000 | 20,75,064 | 4,24,936 | 83 |
| 2103- යන්ත්‍ර | 1,81,30,000 | 1,81,29,257 | 743 | 100 |
| 2401-පුහුණු කිරීම හා හැකියා වර්ධනය | 9,00,000 | 7,48,045 | 1,51,955 | 83 |
| 2502- වෙනත් ආයෝජන | 4,94,00,000 | 4,93,13,665 | 86,335 | 100 |
| **එකතුව** | 8,69,50,000 | 8,52,30,066 | 17,19,934 | |
| **මුළු පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්** | **69,50,00,000** | **68,38,85,606** | **1,11,14,394** | |

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම 2012 - කාර්ය සාධනය


| | |
|---|---|
| 2012 වර්ෂයේ උපරිම හර සීමාව | 2,35,50,000 |
| 2012 වර්ෂයේ නිලධාරීන්ට ණය ගෙවීම් | 2,24,05,998 |
| 2012 වර්ෂයේ අවම ලැබීම් සීමාව | 1,80,00,000 |
| 2012 වර්ෂයේ ණය වාරික අය කිරීම් | 2,58,15,251 |

ඇමුණුම -02


**ආදායම් රැස්කිරීම - ගමන් බලපත්, වීසා, ද්විත්ව පුරවැසි හා වෙනත්.**

| | 2011 | 2012 |
|---|---|---|
| ජනවාරි | 30,30,04,038 | 42,34,73,825 |
| පෙබරවාරි | 21,48,39,689 | 53,66,25,862 |
| මාර්තු | 31,94,06,253 | 54,36,07,555 |
| අප්රේල් | 24,39,85,698 | 40,56,58,563 |
| මැයි | 34,81,13,955 | 49,48,21,446 |
| ජූනි | 30,64,71,158 | 45,71,36,202 |
| ජූලි | 31,67,02,508 | 59,87,87,277 |
| අගෝස්තු | 30,21,45,826 | 59,44,24,541 |
| සැප්තැම්බර් | 31,90,68,875 | 50,78,41,606 |
| ඔක්තෝබර් | 32,07,14,437 | 51,23,54,518 |
| නොවැම්බර් | 29,49,51,816 | 53,16,31,068 |
| දෙසැම්බර් | 47,52,53,494 | 57,48,89,140 |
| **එකතුව** | **3,76,46,57,745** | **6,18,12,51,604** |

ඇමුණුම 03


ආදායම රැස්කිරීම -ගමන් බලපත්, වීසා, ද්විත්ව පුරවැසි හා වෙනත්
ආදායම (රු.)
700000000
600000000
500000000
400000000
300000000
200000000
100000000
0
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්
2011
2012

ඇමුණුම 4




| ගමන් බලපත් | තොටුපල | වීසා | විද්‍යුත් සංචරන අනුමැතිය | ද්විත්ව පුරවැසි |
|---|---|---|---|---|
| 3,16,17,52,072 | 4,92,19,000 | 69,68,96,744 | 2,10,42,01,938 | 16,91,81,850 |

ඇමුණුම - 05

## ආදායම් සාරාංශය 2012

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

| මාසය | ගමන් බලපත් ආදායම<br>1 | ප්රා.ලේ.ආදායම<br>2 | විදේශ දූත මණ්ඩල<br>3 | මුළු එකතුව<br>4 | තොටුපල<br>5 | වීසා<br>6 | විද්යුත් සංචරන අනුමැතිය | ද්විත්ව පුරවැසි<br>7 | මුළු ආදායම<br>8 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 18,49,76,276.60 | 47,65,712.92 | | 18,97,41,989.52 | 35,97,000.00 | 5,34,77,045.00 | 13,67,94,790.12 | 3,98,63,000.00 | 42,34,73,824.64 |
| පෙබරවාරි | 16,80,23,380.66 | 45,06,300.00 | 6,63,03,955.06 | 23,88,33,635.72 | 38,03,000.00 | 4,78,52,304.50 | 21,23,41,922.26 | 3,37,95,000.00 | 53,66,25,862.48 |
| මාර්තු | 18,31,07,488.50 | 53,55,500.00 | 8,95,69,990.60 | 27,80,32,979.10 | 43,20,000.00 | 5,66,00,824.75 | 17,29,61,251.04 | 3,16,92,500.00 | 54,36,07,554.89 |
| අප්රේල් | 14,81,52,855.33 | 39,31,822.24 | 8,32,89,037.65 | 23,53,73,715.22 | 42,19,000.00 | 4,57,71,744.76 | 10,95,28,503.17 | 1,07,65,600.00 | 40,56,58,563.15 |
| මැයි | 19,43,83,942.08 | 57,36,910.00 | 8,09,08,104.32 | 28,10,28,956.40 | 40,68,000.00 | 5,47,98,010.79 | 14,56,55,478.74 | 92,71,000.00 | 49,48,21,445.93 |
| ජුනි | 18,07,24,268.26 | 53,07,000.00 | 6,75,71,678.93 | 25,36,02,947.19 | 42,25,000.00 | 5,69,83,047.00 | 12,53,86,707.82 | 1,69,38,500.00 | 45,71,36,202.01 |
| ජුලි | 19,78,39,965.15 | 59,71,140.00 | 8,22,49,364.78 | 28,60,60,469.93 | 40,75,000.00 | 7,36,99,883.50 | 22,86,71,924.15 | 62,80,000.00 | 59,87,87,277.58 |
| අගෝස්තු | 25,12,11,222.57 | 50,92,500.00 | 10,78,36,228.46 | 36,41,39,951.03 | 36,63,000.00 | 7,63,33,872.68 | 14,21,98,467.64 | 80,89,250.00 | 59,44,24,541.35 |
| සැප්තැම්බර් | 16,68,79,796.39 | 45,50,500.00 | 8,52,25,285.98 | 25,66,55,582.37 | 33,56,000.00 | 5,63,86,506.10 | 18,91,95,017.75 | 22,48,500.00 | 50,78,41,606.22 |
| ඔක්තෝබර් | 16,47,97,876.96 | 50,06,050.00 | 6,75,72,971.63 | 23,73,76,898.59 | 41,89,000.00 | 5,80,65,675.85 | 20,78,62,943.09 | 48,60,000.00 | 51,23,54,517.53 |
| නොවැම්බර් | 16,87,19,501.12 | 56,25,650.00 | 10,01,85,326.76 | 27,45,30,477.88 | 55,09,000.00 | 5,98,22,144.00 | 18,89,74,446.33 | 27,95,000.00 | 53,16,31,068.21 |
| දෙසැම්බර් | 15,72,24,691.00 | 43,48,600.00 | 10,48,01,178.32 | 26,63,74,469.32 | 41,95,000.00 | 5,71,05,685.10 | 24,46,30,485.86 | 25,83,500.00 | 57,48,89,140.28 |
| එකතුව | 2,16,60,41,264.62 | 6,01,97,685.16 | 93,55,13,122.49 | 3,16,17,52,072.27 | 4,92,19,000.00 | 69,68,96,744.03 | 2,10,42,01,937.97 | 16,91,81,850.00 | 6,18,12,51,604.27 |